## ශ්‍රී ලංකා රජය හා කෘෂි වන වගා පර්යේෂණ පිළිබඳ ජාත්‍යන්තර මධ්‍යස්ථානය අතර සත්කාරක ගිවිසුමකට එළඹීම

දේශගුණ විපර්යාසයන්හි අහිතකර බලපෑම් හමුවේ ශ්‍රී ලංකාව සවිබල ගැන්වීමට අවශ්‍ය අන්තර්ජාතික විද්‍යාත්මක, තාක්ෂණික සහ මූල්‍ය සහයෝගය ලබා ගැනීම සඳහා කෘෂි වන වගා පර්යේෂණ පිළිබඳ ජාත්‍යන්තර **මධ්‍යස්ථානය** සමඟ ගිවිසුමකට එළඹීම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය හිමිවිය. ඒ අනුව අද දින එනම් 2022.09.14 වන දින ශ්‍රී ලංකා රජය නියෝජනය කරමින් පරිසර අමාත්‍යාංශය සහ කෘෂි වන වගා පර්යේෂණ පිළිබඳ ජාත්‍යන්තර **මධ්‍යස්ථානය** අතර සත්කාරක රාජ්‍ය ගිවිසුම සඳහා අත්සන් තැබීම පරිසර අමාත්‍යාංශයේ ලේකම් වෛද්‍ය අනිල් ජාසිංහ මහතාගේ අනුදැනුම සහ උපදේශකත්වයෙන් සිදු කරන ලදී.

එම රාජ්‍ය ගිවිසුම සඳහා ශ්‍රී ලංකා රජය වෙනුවෙන් විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂක ජෙනරාල් අජිත් අබේසේකර මහතා සහ කෘෂි වන වගා පර්යේෂණ පිළිබඳ ජාත්‍යන්තර **මධ්‍යස්ථානය** වෙනුවෙන් අධ්‍යක්ෂක ජෙනරාල් ආචාර්ය ඇන්තනි සයිමන්ස් මහතා යන අය අත්සන් කරන ලදී

කෘෂි වන වගා පර්යේෂණ පිළිබඳ ජාත්‍යන්තර **මධ්‍යස්ථානය** ය වර්ෂ 1992 දී අන්තර්ජාතික කෘෂිකර්ම පර්යේෂණ පිළිබඳ උපදේශක සමූහයේ ප්‍රධානතම ජාත්‍යන්තර පර් යේෂණ මධ්‍යස්ථානය ලෙස පිළිගන්නා ලදී.මිනිසාගේ සහ පරිසර යේ යහපැවත්ම වෙනුවෙන් ශාකවල දායකත්වය සහතික කිරීම සඳහා ක්‍රියාත්මක වන විශිෂ්ටතම විද්‍යාත්මක මධ්‍යස්ථානයක් වශයෙන් කෘෂි වන වගා පර්යේෂණ පිළිබඳ ජාත්‍යන්තර **මධ්‍යස්ථානය** ලොව පුරා පිළිගැනීමකට ලක් වී ඇත. මෙම ආයතනය ආහාර සුරක්ෂිතතාවය සහ පාරිසරික තිරසාරභාවය සහතික කරනු වස් සංවර්ධනය වෙමින් පවතින රටවල ගොවිබිමේ සිට සිට ගෝලීය තලය දක්වා දැනුම සහ ඒ ආශ්‍රිත ක්‍රියාකාරකම් ප්‍රවර්ධනය මෙන්ම කෘෂි වන වගාවන් පිළිබඳ පර්යේෂණ සිදුකරනු ලැබේ.

කෘෂි වන වගා පර්යේෂණ පිළිබඳ ජාත්‍යන්තර **මධ්‍යස්ථානය** මඟින් ශ්‍රී ලංකාවේ පරිසර සංරක්ෂණය, ඉහළ ජලාධාර පෝෂක ප්‍රදේශ සංරක්ෂණය, ජල මූලාශ්‍ර සංරක්ෂණය, පාංශු සංරක්ෂණය හා කෘෂි වනවගාව පිළිබඳ ව්‍යාපෘති යෝජනා සකස් කිරීම හා ව්‍යාපෘති යෝජනා ක්‍රියාත්මක කිරීම සඳහා තාක්ෂණික සහය, විශේෂඥ උපදෙස් සහ මූල්‍යාධාර ලබා දී ඇත.

එමෙන්ම කෘෂි වන වගා පර්යේෂණ පිළිබඳ ජාත්‍යන්තර **මධ්‍යස්ථානය** එහි දකුණු ආසියානු කලාපීය මධ්‍යස්ථානය හරහා තිරසාර සංවර්ධන ඉලක්ක කලාපීය වශයෙන් ලඟාකර ගැනීමට සහාය වෙමින් පර්යේෂණ කාර්ය ද සිදු කරනු ලැබේ.

මේවන විට විවිධ පාරිසරික ගැටළු රැසකට මුහුණදෙමින් පවතින ශ්‍රී ලංකාවේ මධ්‍යම කඳුකරයේ ඉහළ ජලාධාර පෝෂක ප්‍රදේශ කළමනාකරණය හා සංරක්ෂණය සඳහා මෙම ආයතනය විසින් ප්‍රමුඛ දායකත්වයක් ලබා දී ඉදිරියේදී ක්‍රියාත්මක වීමට අපේක්ෂා කරනු ලැබේ.

කෘෂි වන වගා පර්යේෂණ පිළිබඳ ජාත්‍යන්තර **මධ්‍යස්ථානය** සමඟ සමීපව කටයුතු කර තිරසාර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමට මෙම සත්කාරක ගිවිසුම ශ්‍රී ලංකාවට ඉමහත් ශක්තියක් හා දායකත්වයක් සපයනු ඇත.





